කුමන ආණ්ඩුවක් බලයට පත්වුව ද, වත්මන් අර්බුදය විසඳීම සඳහා දියත් කළ යුතු ප්‍රතිමෙහෙයුම හෙවත් මහජනයා සමග ඇති කරගත යුතු ඒකඟතාව

ශ්‍රී ලංකාවේ රාජ්‍යය දණගස්වා, ඉන්දියාවේ 29 වැනි ප්‍රාන්තය බවට පත්කිරීමේ මෙහෙයුම පරදවන...

හිසක් නැති ජන අරගලයට හිසක් සපයන...

පාලකයන්ගේ මොළය පාදන...

ජන මනස සුවපත් කරන...

රට අර්බුදයෙන් ගොඩ ගන්න...

දීර්ඝ කාලීන ව ජාතිය දෙපයින් සිටුවන...

# හැට එක් වැදෑරුම් සමාජ ගිවිසුම

උපාය මාර්ග 5ක් තුළ, මාර්ගෝපදේශ 61ක්...
ඊට අදාළ ව ක්‍රියාකාරකම් 108ක් සහ ප්‍රතිඥා 11ක්...

සමාජයට ඉදිරිපත් කිරීම

**ජාතික මහජන සභාව**

# පූර්විකාව:

පස් වැදෑරුම් උපාය මාර්ගික ප්‍රවේශයක් යටතේ ඉදිරිපත් කරනු ලබන මෙම හැට වැදෑරුම් ක්‍රියාකාරකම්, කොටස් වශයෙන් නොව, සමස්තයක් ලෙස සමාජ ගිවිසුමක ආකාරයෙන් ක්‍රියාත්මක කළ යුතු ය. මෙම යෝජනා මගින්, මූලික ව ගෙවුම් ශේෂ හිඟය සහ විදේශ ණය ආපසු ගෙවීම පිළිබඳ කෙටිකාලීන අර්බුදයට මුහුණ දෙමින්, දීර්ඝකාලීන ව ආර්ථිකයේ පදනම ශක්තිමත් කිරීම මගින් අර්බුදය ජය ගැනීම අපේක්ෂා කෙරේ. ඊට අදාළ මූලික පූර්ව කොන්දේසිය වන්නේ මහජන විශ්වාසය තහවුරු කිරීම සඳහා ආණ්ඩුවේ සද්භාවය ප්‍රදර්ශනය කිරීම ය.

ඒ සියල්ලට අදාළ පළමු ප්‍රවේශය වන්නේ මෙම යෝජනා සමාජ ගිවිසුමක් ලෙස නොපිරිහෙළා ඉටුකරන බවට මහා හඬකින් පොරොන්දු වීම සහ ඒ සඳහා නිශ්චිත ඉලක්ක සහිත කාල රාමුවකට එකඟවීම ය. එම ක්‍රියාවලිය තුළ පැතිකඩ දෙකකින් මහජන විශ්වාසය දිනාගත යුතු වේ. පළමු වැන්න, රාජ්‍ය පාලනයට අදාළ ව වංචා දූෂණ වැළැක්වීම සහ මහජන වගවීම සහ විනිවිද භාවය තහවුරු කිරීම ය. දෙවැන්න, 1977 සිට පවත්වාගෙන එනු ලැබූ පරාධීන ආර්ථික මොඩලය මූලික පදනමින් ම වෙනස් කිරීම සඳහා පියවර ගැනීම ය.

## ආර්ථික සහ දේශපාලන අර්බුදය විසඳීම සඳහා වන පස් වැදෑරුම් උපාය මාර්ගික ප්‍රවේශය

1. හදිසි තත්ත්වය, එනම් විදේශ විනිමය අර්බුදය සහ රාජ්‍ය මූල්‍ය අර්බුදය කෙටි කාලීන ව සමනය කිරීම සහ එම තත්ත්වය තවදුරටත් වර්ධනය වීම වැළැක්වීම.

2. දේශීය නිෂ්පාදන පද්ධතිය ආරක්ෂා කිරීම සහ ශක්තිමත් කිරීම, බහුතර ජනයාගේ ජීවන තත්ත්වය ආරක්ෂා කිරීම සහ ආර්ථික ඉඩප්‍රස්ථා වර්ධනය කිරීම මෙන්ම, රටේ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම හරහා රටේ ආර්ථික මොඩලය වෙනස් කිරීම සහ ඒ මගින් විශේෂයෙන්ම රටේ වෙළෙඳ හිඟය  පියවීම.

3. දූෂණ වංචා පාලනය සඳහා දැඩි ක්‍රියාමාර්ග ගැනීම. ඊට අදාළ වැරදිකරුවන්ට දඬුවම් ලබා දීම මෙන්ම, ප්‍රබල මහජන අපේක්ෂා සහ ඉල්ලීම් ඉටුකිරීම මගින් රාජ්‍ය පාලනය පිළිබඳ මහජන විශ්වාසය තහවුරු කිරීම.

4. බලශක්ති අර්බුදය විසඳීම සහ දීර්ඝ කාලීනව බලශක්ති සුරක්ෂිතතාවය සහ ඊට අදාළව රටේ ස්වාධිපත්‍යය ආරක්ෂා කිරීම.

5. ආර්ථික මොඩලය වෙනස් කිරීමේ දිගුවක් ලෙස ජාතිය සතු මහා සම්පත් විභවය සහ භූ දේශපාලන වාසිදායක තත්වයන් යොදාගනිමින්, ස්වෛරී බලවත් රටක් ලෙස නැඟීසිටිය හැකි බවට මහජන විශ්වාසය ගොඩනැඟීම තුළින් මහජන සහාය දිනා ගැනීම සඳහා ජාතික උපායමාර්ගික ව්‍යාපෘති පද්ධතියක් ප්‍රකාශයට පත්කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා බහු පාර්ශ්වීය කර්යසාධන යාන්ත්‍රණයක් පිහිටුවීම.

## සටහන

# 1

# හදිසි තත්ත්වය, එනම් විදේශ විනිමය අර්බුදය සහ රාජ්‍ය මූල්‍ය අර්බුදය කෙටි කාලීන ව සමනය කිරීම සහ එම තත්ත්වය තවදුරටත් වර්ධනය වීම වැළැක්වීම.

**1.1** I. රාජ්‍යවලින් ලබාගත් විදේශ ණය සහ බහු පාර්ශ්වීය ආයතනවලින් ලබා ගත් විදේශ ණය, නැවත ප්‍රතිව්‍යුහගත කිරීමට අදාළ සාකච්ඡා සඳහා නිලධාරීන් සහ අදාළ රටවල් සමග සාකච්ඡාවට සුදුසු දේශපාලන පක්ෂ නායකයන්ගෙන් සමන්විත කමිටු පත් කිරීම සහ ඒවාට බලය පැවරීම. එමෙන්ම ස්වෛරී බැඳුම්කර සහ වාණිජ ණය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ ව සාකච්ඡා කිරීම සඳහා දේශීය හෝ විදේශීය මූල්‍ය උපදේශන ආයතනයක සහාය ලබාගැනීම.

II. ජාත්‍යන්තර සහාය ලබාගැනීම සඳහා මූලික පූර්ව කොන්දේසියක් ලෙස ආණ්ඩුවේ ස්ථාවරභාවය ප්‍රදර්ශනය කිරීම මුල් කරගෙන ජාතික එකඟතා ආණ්ඩුවක් මගින් රටට ඉදිරිපත් කරන වැඩපිළිවෙළට අදාළ ව මහජන සහය ලබාගැනීම සඳහා පුළුල් මහජන සංවාදයක් ඇති කිරීම. (එම ක්‍රියාවලිය තුළ මහජනයාට සත්‍ය අවබෝධ කර ගැනීම සඳහා 2006 සිට 2022 දක්වා විවිධ මහ බැංකු අධිපතිවරුන් යටතේ වාණිජ පොළිය මත නිකුත් කළ ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කරවල වටිනාකම, පොළී අනුපාතය සහ පරිණත වන කාලය ප්‍රකාශයට පත් කළ යුතු ය.)

**1.2** I. අත්‍යවශ්‍ය නොවන ද්‍රව්‍ය සහ අතිසුඛෝපභෝගී භාණ්ඩ ආනයනය සඳහා බලපත්‍ර ලබා දීම වෙනුවට, ඒවා ආනයනය සම්පූර්ණයෙන් ම වසරක කාලයක් සඳහා අත්හිටුවීම සහ එම භාණ්ඩ සහ ද්‍රව්‍ය ලයිස්තු ප්‍රසිද්ධියට පත්කිරීම මගින් විනිවිදභාවය සහිත ව මහජන සහාය ලබාගැනීම.

II. ඊට අමතරව, මේ වන විට ආනයනය කර ඇති තොග සැඟවීම සහ මිල ඉහළ දැමීම වැළැක්වීම සඳහා පාරිභෝගික අධිකාරිය මගින් විශේෂ වැටලීම් ඒකකයක් ද පිහිටුවිය යුතු ය.

III. එම ක්‍රියාවලිය තුළ සමස්තයක් ලෙස පරිභෝජනය අධෛර්යමත් කරමින් ඉතිරි කිරීම් දිරිමත් කිරීම සඳහා ආනයන බදු අනුපාත සහ පොළී අනුපාත ඉහළ දැමීම අත්‍යවශ්‍ය පූර්ව කොන්දේසියකි.

**1.3** I. ඩොලර් බැඳුම්කර මිල දී ගැනීමට හෝ ස්ථිර තැන්පතුවල යම් නිශ්චිත මුදල් ප්‍රමාණයක් තැන්පත් කිරීමට කැමැති විදේශගත ශ්‍රී ලාංකිකයන් සඳහා බදු සහන සහිත වාහන ආනයන බලපත්‍ර ලබාදීම. එම වාහන ආනයනය සහ අදාළ බදු ගෙවීම සඳහා ඔවුන් සතු විදේශ මුදල් භාවිත කළ යුතු ය.

II. එසේ ම, බැංකු හරහා විදේශ මුදල් ගනුදෙනු කරන විදේශගත ශ්‍රී ලාංකිකයන්ට සුවිශේෂී තීරු බදු සහන පැකේජයක් හඳුන්වාදීම සහ "කළු වෙළෙඳපොළ" තුළ මිලට සාපේක්ෂ ව ආකර්ශනීය අමතර දීමනාවක් රුපියල්වලින් ගෙවීම මගින් කෙටිකාලීනව "කළු වෙළෙඳ පොළට" මුදල් සැපයීම පාලනය කිරීම. (එසේ ම, තම මාතෘභූමියේ දුෂ්කර අවස්ථාව පියමන් කිරීම සඳහා බැංකු මගින් පමණක් ගනුදෙනු කරන ලෙස රටේ සමස්ත ජනතාව වශයෙන් ඔවුන්ගෙන් ඉල්ලීම ද ඉතා වැදගත් වේ.)

III. ඊට අමතර ව, විදේශීය රැකියා නියුක්තිකයන්ගේ සුබ සාධනය සඳහා ඔවුන්ගේ ආදායම් මට්ටම, රැකියාව සහ රටට එවන මුදල් ප්‍රමාණය ආදිය මත පදනම් ව තීරු බදු සහන, රක්ෂණ ආවරණ සහ ආපසු රටට පැමිණීමෙන් පසු අයෝජන සංවර්ධන ණය සහ බැංකු මගින් ප්‍රාග්ධන කොටස් මිල දී ගැනීම හරහා ආයෝජන ව්‍යාපෘතිවලට සහාය වීම ආදිය ඇතුළත් සහන පැකේජයක් ප්‍රකාශයට පත් කිරීම.

IV. ඉහත කර්තව්‍යයන් සඳහා විදේශ රැකියා නියුක්තිකයන් සඳහා ම වෙන් වූ සුවිශේෂී බැංකුවක් හෝ පවතින රාජ්‍ය බැංකුවක විශේෂ අංශයක් පිහිටුවීම සහ විදේශ විනිමය ප්‍රේෂණ වර්ධනය කිරීමට අදාළව පසුගිය වසරේදී මහ බැංකුව විසින් පිහිටුවූ, එහෙත් මේ වනතුරු ක්‍රියාත්මක නොවන, විශේෂිත අංශය වහාම සක්‍රීය කිරීම.

**1.4** ඉන්දියාව, චීනය, ජපානය සහ රුසියාව සමග දේශීය කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය ඇතුළු නිශ්චිත භාණ්ඩ ලයිස්තුවක් ආනයනය කිරීම සඳහා භාණ්ඩ මිල දී ගැනීමේ ණය ඉල්ලා සිටීම. (Credit Line) රුපියල්, යෙන්, යුවාන් සහ රූබල්වලින් ලබාගන්නා එම ණය ගෙවීම සඳහා එම රටවලින් ලැබෙන අපනයන ආදායම් යොදාගැනීම පිළිබඳ ව සාකච්ඡා කළ යුතු ය. (එම සාකච්ඡා කමිටුවලට අදාළ රටවල් සමග සම්බන්ධතා සහිත දේශපාලන නායකයින් යොදාගැනීම වැදගත් වේ.) එම ක්‍රියාවලිය තුළ රුසියාව සමග සිදුකරන සාකච්ඡාවලදී ඛණිජ තෙල්, ගෑස් සහ රසායනික පොහොර ලබාගැනීම පිළිබඳව විශේෂිතව සාකච්ඡා කළ යුතු ය.

**1.5** හදිසි අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ආනයනය සහ ප්‍රතිව්‍යුහගත කරනු ලබන විදේශ ණයවල ණය වාරික ගෙවීමට අවම සංචිත ප්‍රමාණයක් පවත්වාගෙන යාම සඳහා ඩොලර් මිලියන 6000ක සහනදායී ණය ලබාගැනීම පිණිස චීනය සහ රුසියාව සමග විශේෂිතව සාකච්ඡා කිරීම. (රුසියාව සහ චීනය සමග පවත්වනු ලබන විශේෂිත සාකච්ඡා ඉන්දියාව සහ මූල්‍ය අරමුදල සමග කරනු ලබන සාකච්ඡා වලට අමතරව සහ ඊට වඩා ප්‍රමුඛතාවකින් යුතුව සිදුකළ යුතු අතර, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග ඇති කරගන්නා එකඟතාවලදී දීර්ඝ කාලීන ව අර්බුදය උග්‍ර වීමට හේතු විය හැකි කොන්දේසිවලට එකග නොවිය යුතු ය.)

**1.6** I. පසුගිය රජය විසින් සංශෝධනය කිරීම මගින් සිදුකරනු ලැබ ඇති ලිහිල් කිරීම් නිසා සිදුවන විදේශ විනිමය පාලනයකින් තොර ව පිටතට ගෙනයෑමේ ක්‍රියාවලිය සහ අපනයන ආදායම් නිසි පරිදි රට තුළට ගෙන ඒම වැළැක්වීමේ ක්‍රියාවලිය, එම පනත නැවත සංශෝධනය කිරීම මගින් නිවැරදි කිරීම.

II. භාණ්ඩ ආනයන අපනයන ක්‍රියාවලිය තුළ විදේශ මුදල් රටට ලැබීම සහ රටින් පිට කිරීමට අදාළ ව බැංකු පද්ධතිය සහ රේගුව මගින් සිදුකළ යුතු අධීක්ෂණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සහ ඊට අදාළව ජාත්‍යන්තර ගනුදෙනු වාර්තා කිරීමේ තොරතුරු පද්ධතිය තුළ (Internatioal Transction Reporting System) පවතින තාක්ෂණික හා පරිපාලන දුර්වලතා නිවැරදි කිරීම.

III. ඊට අමතර ව, මුදල් පනත සංශෝධනය කිරීම මගින් හඳුන්වා දී ඇති "නිදහස් වරාය ක්‍රමය" නමින් සිදුකරන ප්‍රති අපනයන ජාවාරම් මගින් කරනු ලබන බදු වංචා සහ විදේශ විනිමය වංචා, එම පනත නැවත සංශෝධනය කිරීම මගින් වහා ම නැවැත්වීම.

VI. ඒ ආකාරයට වාර්ෂික ව රටට අහිමි වන බවට තක්සේරු කෙරෙන ඩොලර් මිලියන 3000 - 4000 පමණ වන වන විදේශ විනිමය ප්‍රමාණය පිළිබඳ ව සොයා බැලීම සහ අදාළ පනත් සංශෝධනය ඇතුළු නිසි ප්‍රතිකර්ම යෝජනා කිරීම සඳහා විද්වත් කමිටුවක් පත් කර, එම ක්‍රියාවලිය මාස 3ක් ඇතුළත අවසන් කිරීම සහ එම නිර්දේශ රටට ඉදිරිපත් කිරීම.

**1.7** I. විදේශ විනිමය වෙළෙඳාමට අදාළ "කළු වෙළෙඳපොළ" පාලනය කිරීම සඳහා මහ බැංකුවේ අදාළ අංශ සහ රහස් පොලීසිය ඇතුළත් කාර්ය සාධක බලකායක් පිහිටුවීම.

II. විශේෂයෙන් ම ඊට අදාළ ව විවෘත ගිණුම් ක්‍රමය මගින් භාණ්ඩ ආනයනය කිරීමේ ක්‍රියාවලිය තුළ අදාළ ගෙවීම් "කළු වෙළඳපොළ" හරහා සිදු කිරීම වහා ම නැවැත්විය යුතු අතර, එම ගෙවීම් බැංකු පද්ධතිය හරහා පමණක් සිදුකළ යුතු බවට මහ බැංකුව මගින් නියමයන් පැනවීම. (එහි දී කිසිදු සමාවකින් තොර ව වැරදිකාර ආයතනවල බලපත්‍ර අත්හිටුවිය යුතු අතර, ඊට අදාළ ව මහජනයා දැනුම්වත් කිරීම සඳහා රාජ්‍ය මාධ්‍ය යොදාගනිමින් ප්‍රචාරක ව්‍යාපාරයක් දියත් කළ යුතු ය.)

**1.8** අපනයනකරුවන්ගෙන් සමන්විත, විවිධ අපනයන ක්ෂේත්‍රවලට අදාළ ව, ආංශික කමිටු ප්‍රමාණයක් පත් කිරීම සහ ඒවා උපාය මාර්ගික ව්‍යාපාරික ඒකක ලෙස ගැටළු විසඳීම මුල්කරගෙන ක්ෂණික මැදිහත් වීම සහ අධීක්ෂණය සඳහා යොදා ගැනීම මගින් අපනයන ක්ෂේත්‍රයේ ගැටලු විසඳීම මෙන්ම ඒ මගින් අපනයන ආදායම් රට තුළට ගෙන ඒම, දිරිමත් කිරීම. ඊට අදාළ ව සිදුවන අක්‍රමිකතා වැළැක්වීම සහ අපනයන වර්ධනය සඳහා පහසුකම් සැලසීම.

**1.9** I. විදේශ විනිමය අර්බුදය මධ්‍ය කාලීන ව ජය ගැනීම සඳහා මූලික පියවරක් ලෙස ඉදිරි වසර තුනක කාලය තුළ විදේශ රැකියා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ වර්ධනය කිරීම සඳහා ඉලක්ක සහගත වැඩසටහනක් මගින් විදේශ රැකියා වෙළෙඳපොළ ඉලක්ක කරමින් වෘත්තීය පුහුණු ක්‍රියාවලිය නැවත ස්ථානගත කිරීම,

II. ඊට අදාළව දෙවැනි පියවර ලෙස දේශීය වෛද්‍ය සේවා මෙන්ම සංස්කෘතික සහ පාරිසරික උරුමය මත පදනම් ව සහ කුඩා සහ මධ්‍යම පරිමාණ සේවා සපයන්නන් මුල් කරගෙන සංචාරක කර්මාන්තය නැවත ස්ථානගත කිරීම මගින් සංචාරක කර්මාන්තයෙන් ලැබෙන විදේශ විනිමය ආදායම් වර්ධනය කිරීම. (උදාහරණයක් ලෙස, ඊට අදාළව දීර්ඝ කාලීනව නවාතැන් ගැනීම දිරිමත් කළ හැකි ජපානය වැනි රටවල සංචාරකයන්ට වීසා නොමැතිව ශ්‍රී ලංකාවට ඇතුළු වීමට අවසර දීම සහ ශ්‍රී ලංකන් ගුවන් සේවය විසින් ඉන්දියාව හෝ පාකිස්ථානය දක්වා ගමන් කරන මගීන්ට වඩා ශ්‍රී ලංකාවට පැමිණෙන මගීන්ට ප්‍රමුඛතාවය ලබාදීම වැනි සරල ක්‍රියාමාර්ගවලින් පවා විශාල වෙනසක් සිදු කළ හැකි බවට සාක්ෂි ඇත.)

III. ඊට අදාළ ව තුන්වැනි පියවර ලෙස දේශීය මිනිරන්වලින් ග්‍රැෆීන් හෙවත් කළු රත්තරන් නිෂ්පාදනය සඳහා ආයෝජනය කිරීම මගින් කර්මාන්ත ක්ෂේත්‍රයේ විදේශ විනිමය ආදායම් වර්ධනය කිරීමට අදාළ ව පිම්මක් පැනීම.

IV. ඊට අදාළ ව හතරවන පියවර ලෙස, පරිගණක මෘදුකාංග ආශ්‍රිත විදේශීය වෙළෙඳපොළට තරගකාරීව ඇතුළත් වීම සඳහා දේශීය මෘදුකාංග සමාගම් සහ ක්ෂේත්‍රයේ විද්වතුන් දිරිමත් කිරීම, ඊට අදාළ ව ධාරිතාව වර්ධනය කිරීම මුල්කරගෙන මූල්‍ය සහන පැකේජයක් ප්‍රකාශයට පත් කිරීම මෙන්ම, එම ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා ක්ෂේත්‍රයේ විද්වතුන්ගේ සහභාගීත්වය සහිත බහුපාර්ශ්වීය පරිපාලන යාන්ත්‍රණයක් පිහිටුවීම.

**1.10** I. වර්තමාන ආණ්ඩුව බලයට පත්වීමෙන් පසු ව සහ ඊට පෙර පැවැති රජය යටතේ ඉවත් කරන ලද සියලු බදු නැවත පැනවීම (උදා: වැට් බදු, ජාතික ආර්ථික බදු, ගුවන් තොටුපොළ බදු, විශේෂ පරිභෝජන බදු ආදියට අදාළව ලබා දී ඇති සියලු බදු සහන අහෝසි කළ යුතු ය)

II. එමෙන් ම රේගුබදු, ආදායම් බදු සහ සුරා බදු වංචා වැළැක්වීම සඳහා පාර්ලිමේන්තුවේ අධීක්ෂණයට යටත් වන ආකාරයට විගණකාධිපති යටතේ තුන්වැනි පාර්ශ්වයක් ලෙස නිරන්තර සොයා බැලීමේ යාන්ත්‍රණයක් පිහිටුවීම.

III. අප රටේ පවතින ඉතා අසාධාරණ බදු ව්‍යුහය තුළ පිළිවෙළින් 86%ක් සහ 14%ක් වන වක්‍ර බදු සහ ඍජු බදු ප්‍රතිශත, ක්‍රමයෙන් 60% සහ 40% දක්වා යම් සාධාරණ මට්ටමකට ගෙන ඒම සඳහා නව බදු ප්‍රතිපත්තියක් හඳුන්වාදීම සහ ඒ තුළ රාජ්‍ය සේවකයන් සඳහා ආදායම් බදු අවම ප්‍රතිශතයක් හෝ පැනවීම මෙන් ම, සේවයේ යෙදෙන රාජ්‍ය සේවයට අයත් වෘත්තිකයන් තම අමතර ආදායම් සඳහා සාධාරණ ලෙස බදු ගෙවන බව සහතික කිරීම සඳහා පරිපාලන යාන්ත්‍රණයක් පිහිටුවීම.

**1.11** රුපියල් 5000 මුදල් නෝට්ටුව අවලංගු කිරීම සහ එම නෝට්ටු අයිතිකරුගේ පෞද්ගලික ගිණුම්වලට බැර කිරීම සඳහා මාස තුනක සමා කාලයක් ලබාදීම.

**1.12** I. ඒක පාර්ශ්වීය තරගකාරී නොවන කොන්ත්‍රාත් ලබාදීමේ ක්‍රමවේදය අත්හිටුවා, ප්‍රසම්පාදන පනත නීතිගත කිරීම මගින් ප්‍රසම්පාදන කොමිසම පිහිටුවීම සඳහා කඩිනම් පියවර ගැනීම.

II. එම කාලය තුළ බරපතළ දූෂණ වංචා චෝදනාවලට ලක්ව ඇති මහා පරිමාණ ව්‍යාපෘති, විශේෂයෙන් ම මධ්‍යම අධිවේගී මාර්ගයේ තෙවැනි කොටසට අදාළ කොන්ත්‍රාත්තුව අත්හිටුවා ඒ සඳහා නැවත ටෙන්ඩර් කැඳවීම.

**1.13** රජයට බදු ආදායම් අහිමි වන තීන්දු සහ මහා පරිමාණ මිල දී ගැනීම් මෙන් ම, මහා පරිමාණ ඉදිකිරීම්වලට අදාළ අවසන් තීන්දු ගැනීමට පෙර අමාත්‍ය මණ්ඩලය මගින් පාර්ලිමේන්තුවේ මුදල් කාරක සභාවල අනුමැතිය සඳහා යොමු කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීන්දුවක් ප්‍රකාශයට පත්කිරීම සහ ඊට අදාළ ව මාර්ගෝපදේශ සංග්‍රහයන් සංශෝධනය කිරීම.

# 2

# දේශීය නිෂ්පාදන පද්ධතිය ආරක්ෂා කිරීම සහ ශක්තිමත් කිරීම, බහුතර ජනයාගේ ජීවන තත්ත්වය ආරක්ෂා කිරීම සහ ආර්ථික ඉඩප්‍රස්ථා වර්ධනය කිරීම මෙන් ම, රටේ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම මගින් රටේ ආර්ථික මොඩලය වෙනස් කිරීම සහ ඒ මගින් විශේෂයෙන් ම රටේ වෙළෙඳ හිඟය පියවීම.

**2.1** I. සියලු ම රාජ්‍ය මිල දී ගැනීම්වල දී (භාණ්ඩ සහ සේවා) දේශීය නිෂ්පාදන මිල දී ගැනීම සඳහා දැනට ලබාදී ඇති ප්‍රමුඛතාව අනිවාර්ය කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තිමය තීන්දුවක් ගැනීම සහ ඊට අනුව වහා ම ප්‍රසම්පාදන සංග්‍රහය සංශෝධනය කිරීම.

II. ඊට සමගාමී ව දේශීය නිෂ්පාදන මිල දී ගැනීම සඳහා මහජනයා පෙළඹවීම මුල් කරගෙන රාජ්‍ය මාධ්‍ය යොදාගනිමින් ජාතික මට්ටමින් ප්‍රචාරක ව්‍යාපාරයක් දියත් කිරීම.

**2.2** දේශීයව විකල්ප නිෂ්පාදන රට තුළ තිබෙන සියලු ම ආහාර සහ සෙසු පරිභෝජන භාණ්ඩවලට තරගකාරී ලෙස ආනයනය කරනු ලබන සියලු ම විදේශ නිෂ්පාදනවල මිල, දේශීය නිෂ්පාදන පිරිවැයට සාපේක්ෂ ව මිල සූත්‍ර මගින් නිර්ණය කරනු ලබන, දේශීය නිෂ්පාදනවල වෙළෙඳපොළ මිලට වඩා 5%-10% අතර ප්‍රමාණයකින් ඉහළ මට්ටමක පවතින ලෙස ආනයන බදු පැනවිය යුතු බවට මූලික පොදු ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීම සහ එය ස්ථාවර ජාතික ප්‍රතිපත්තියක් ලෙස ප්‍රකාශයට පත් කිරීම (අදාළ භාණ්ඩ සහ ද්‍රව්‍ය ලයිස්තුව සහ බදු ප්‍රමාණය ප්‍රකාශයට පත් කළ යුතු අතර, එහි පරමාර්ථය පැහැදිලි කරමින් මහජන සහාය ලබාගැනීම සඳහා ප්‍රචාරක සහ අධ්‍යාපන වැඩසටහනක් දියත් කිරීම ද වැදගත් වේ.)

**2.3** එසේ පනවනු ලබන ජාතික ආර්ථිකය ආරක්ෂා කිරීම සඳහා වන ආනයන බදු, විශේෂිත ජාතික අරමුදලකට බැරවිය යුතු අතර, එම අරමුදල් අඩු ආදායම්ලාභීන්ට සහන ලබා දීම සහ ගොවීන් අතට ලැබෙන නිෂ්පාදන සහනාධාර ලබාදීම සඳහා පමණක් යොදවන බව සහතික කිරීම සහ ප්‍රතිලාභීන්ට අදාළ තොරතුරු සැඟවීමෙන් තොරව ප්‍රකාශයට පත්කිරීම.

2.4 I. අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සඳහා පාලන මිල නැවත පැනවීම සහ එය මූලික ජාතික ප්‍රතිපත්තියක් ලෙස පිළිගැනීම මෙන් ම, ඊට අදාළ ආවේක්ෂණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම.

II. එසේ ම ආනයනික සහ දේශීය ආහාර ද්‍රව්‍ය බාල කිරීම මගින් මිල අඩුකිරීම වැළැක්වීම සඳහා එවැනි බාල කළ ද්‍රව්‍ය ආනයනය කිරීම ආනයන අපනයන පාලන පනත යටතේ තහනම් කිරීම සහ ඒවා දේශීය ව විකිණීම පාරිභෝගික අධිකාරි පනත යටතේ තහනම් කිරීම.

2.5 I. වී සඳහා අවම මිල (සහතික මිල නොවේ) කිලෝ ග්‍රෑම් එකකට රුපියල් 80.00ක් හා කිරි සඳහා අවම මිල ලීටරයට රුපියල් 100.00ක් ලෙස පැනවීම සහ ඊට අනුව දේශීය වටිනාකම් එකතු කිරීමේ කර්මාන්ත පද්ධතියේ පැවැත්ම සහතික වන ආකාරයට මිල සූත්‍ර හඳුන්වාදීමෙන් පසු ව සහල් සහ කිරිපිටිවල වෙළෙඳපොළ මිල නියම කිරීම.

II. එසේ ම, ආහාරයට ගන්නා තෙල්වලට අදාළ ව පොල්තෙල් ආනයනය වෙනුවට අමුද්‍රව්‍ය (වියළි පොල් කැබලි) ආනයනය කිරීම මගින් දේශීය පොල් තෙල් නිෂ්පාදනය දිරි ගැන්වෙන ආකාරයට සහ පොල්තෙල් ආනයනය අධෛර්යමත් කෙරෙන ආකාරයට ආනයන බදු ප්‍රතිපත්තියක් හඳුන්වාදීම.

2.6 I. දැනට පවතින, මැර බලය ක්‍රියාත්මක වන සහ ගොවියා යටත් කරන මිල දී ගැනීමේ ආර්ථික මධ්‍යස්ථාන වෙනුවට, ගොවියාට සහ ගොවි සංවිධානවලට බලය සහිත විකිණීමේ ආර්ථික මධ්‍යස්ථාන පිහිටුවීම සහ සමුපකාර ජාලයක් මගින් ඊට සහාය වීම. (පවතින මධ්‍යස්ථාන පරිවර්තනය කිරීම දේශපාලන වශයෙන් දුෂ්කර වේ නම් නව තාවකාලික මධ්‍යස්ථාන පිහිටුවිය හැකි ය.)

II. එම ක්‍රියාවලිය හරහා වටිනාකම් එකතු කිරීම සහ කල් තබා ගැනීම දිරිමත් කිරීම මගින් මිල ස්ථාවර කිරීම සඳහා රජය මගින් සහනාධාර පැකේජයක් ලබාදිය යුතු අතර, ඒ සඳහා ගොවි සමුපකාර සහ අලෙවි සහ සමුපකාර ජාලයක් යොදා ගත හැකි ය.

III. ධීවර නිෂ්පාදන ආශ්‍රිත ව ද ධීවරයාගේ කේවල් කිරීමේ බලය ආරක්ෂා වන ආකාරයට සහ ඔහුට සාධාරණ මිල ලැබෙන ආකාරයට ධීවර සංවිධානවලට බලය සහිත විකිණීමේ මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ධීවර සමුපකාර පිහිටුවීම සහ ඒ සඳහා රාජ්‍ය සහනාධාර ලබාදීම.

IV. ඊට අමතර ව යම් කාලවල මාළු මිල පහත වැටීම වැළැක්වීම සඳහා පෞද්ගලික අංශය සහ සමුපකාරය යොදා ගනිමින් මධ්‍යම පරිමාණ මාළු ටින් කිරීමේ කර්මාන්ත ශාලා ජාලයක් ස්ථාපිත කිරීම දිරිමත් කිරීම සඳහා රාජ්‍ය සහනාධාර ලබාදීම.

2.7 භාණ්ඩ සැඟවීම සහ ඒ මගින් මිල ඉහළ දැමීම වැළැක්වීම සඳහා පාරිභෝගික අධිකාරිය සහ පොලිසිය යොදා ගනිමින් දැඩි ක්‍රියාමාර්ග ගැනීම සහ ඒ සඳහා මහජන සහාය ලබාගැනීම. (ඊට අදාළ ව තමා සතු තොග තොරතුරු සහ ඉන්වොයිස් පත්‍ර ඉදිරිපත් කරන ලෙස තොග වෙළෙඳුන්ට නිවේදනයක් නිකුත් කිරීමෙන් පසු ව භෞතිකව සොයා බැලීමේ සහ භාණ්ඩ වෙළෙඳපොළට නිකුත් කිරීමේ ක්‍රියාවලිය දියත් කළ යුතු ය.)

2.8 කර්මාන්තකරුවන් විසින් ලබා ගනු ලැබ ඇති සංවර්ධන ණය සහ ලීසිං පහසුකම්වලට අදාළව දේපළ පවරාගැනීම සහ දණ්ඩන පොළිය අය කිරීම වසරකට අත්හිටුවීම සහ පොළී සහනාධාරයක් යටතේ අදාළ ණය ප්‍රතිව්‍යුහගත කිරීම. එම ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සහ පැමිණිලි සහ දුක් ගැනවිලි විභාග කිරීම සඳහා කාර්ය සාධක බලකායක් පිහිටුවීම සහ දිස්ත්‍රික් මධ්‍යස්ථාන පිහිටුවීම.

2.9 I. කුඩා නිෂ්පාදකයා සහ ගොවියා මූල්‍ය වහල්භාවයෙන් ගලවාගැනීම සහ ඔවුන් ඵලදායි ලෙස ආර්ථිකයට දායක කරගැනීම සඳහා ක්ෂුද්‍ර මූල්‍ය ණය සඳහා වහා ම උපරිම පොළී මට්ටම නියම කිරීම, දණ්ඩන පොළිය අයකිරීම අත්හිටුවීම, ප්‍රාග්ධනය ඉක්මවා යන ප්‍රමාණයට වඩා පොළිය අයකර ඇති ණයවල අනාගත පොළී අයකිරීම අත්හිටුවීම ආදී ක්‍රියාමාර්ග ගැනීම සහ අදාළ ක්‍රියාවලිය අධීක්ෂණය කර මාසික ව වාර්තා කිරීම සඳහා මහ බැංකුවට නියම කිරීම.

II. ක්ෂුද්‍ර මූල්‍ය ණය වෙළෙඳපොළ තුළ රජයේ වගකීම තහවුරු කිරීම සඳහා 'දිවි නැගුම' බැංකු පද්ධතිය වහා ම ප්‍රතිව්‍යුහගත කිරීම, 'ගොවිජන බැංකුව' නැවත ආරම්භ කිරීම සහ ග්‍රාමීය සමුපකාර බැංකු පද්ධතිය සඳහා මෙන් ම, නියම කරනු ලබන පොළියට ණය ලබාදෙන පෞද්ගලික ආයතන සඳහා බැංකු පද්ධතිය මගින් සහන පොළියට තොග ණය ලබා දීම.

III. කුඩා නිෂ්පාදකයන්ට වෙළෙඳපොළ පුළුල් කිරීම සඳහා දිවිනැගුම, කෘෂිකර්ම, ගොවිජන සේවා ආදී රාජ්‍ය ආයතන සහ පළාත් පාලන ආයතන යොදා ගනිමින් නිෂ්පාදකයාට පමණක් සහභාගි විය හැකි දිනපතා වෙළෙඳපොළවල් ආරම්භ කිරීම සඳහා රාජ්‍ය අය වැය මගින් ප්‍රතිපාදන වෙන් කිරීම.

IV. පාසල්, රෝහල්, ආරක්ෂක හමුදා කඳවුරු සහ රාජ්‍ය ආයතන ආශ්‍රිත ව දේශීය ආහාර ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම අනිවාර්ය කිරීම මගින් කුඩා නිෂ්පාදකයා සඳහා වෙළෙඳපොළ පුළුල් කිරීම.

V. දැනට පවතින 'හෙළ බොජුන් හල්' ජාලය ඉහත සඳහන් කළ රාජ්‍ය ආයතන යොදාගනිමින් වඩා විධිමත් ව පුළුල් කිරීම සහ විධිමත් අධීක්ෂණයකට ලක් කිරීම සඳහා යාන්ත්‍රණයක් හඳුන්වාදීම.

2.10 I. මහ කන්නය සඳහා රජය මගින් ආනයනය කර වෙළෙඳපොළ මිලට ගොවියාට පොහොර ලබාදීම සහ පොහොර සහනාධාරය ගොවිජන බැංකුව යොදාගනිමින් ගොවියාට මුදලින් ගෙවීම. (ඒ මගින් ගොවිජන බැංකුවට ප්‍රාග්ධනය ලබාදීම ද සිදුකළ හැකි ය.)

II. වහා ම අවම පළිබෝධනාශක ලයිස්තුවක් නීතිගත කිරීම මගින් පළිබෝධනාශක භාවිතය අවම කිරීම.

III. ඊට අමතර ව, වසර පහක දී ගොවියාගේ ස්වේච්ඡා කැමැත්ත සහ දායකත්වය සහිතව කෘෂි රසායනික භාවිතය ක්‍රමයෙන් අවම කිරීම සඳහා ස්වභාවික ගොවිතැන් ක්‍රම ප්‍රචලිත කිරීමට අදාළ ව ජාතික සැලැස්මක් රටට ඉදිරිපත් කිරීම සහ එය ක්‍රියාත්මක කිරීම සඳහා කාර්ය සාධක බලකායක් පිහිටුවීම. (පාංශු සංරක්ෂණ පුරුදු පිළිගැන්වීම සහ පාංශු පරීක්ෂාවට අදාළ පහසුකම් සැළසීම, බෝග වගාව සමග කිරි ගොවිතැන ඒකාබද්ධ කිරීම, ගොවිපල ආශ්‍රිත කාබනික ද්‍රව්‍ය පසට යෙදීම දිරිගැන්වීම සහ ආනයනික කාබනික ද්‍රව්‍ය හෝ මිල දී ගන්නා කාබනික ද්‍රව්‍ය යෙදීම අධෛර්යමත් කිරීම ආදී ක්‍රියාමාර්ග මෙම වැඩ සටහනට අයත් විය යුතු ය.)

IV. එප්පාවල පොස්පේට් නිධිය භාවිත කරමින් දේශීය අවශ්‍යතාවට පමණක් සිංගල් සුපර් පොස්පේට් නිපදවීම සඳහා රජය මගින් ආයෝජනය කිරීම. (ඒ සඳහා පොහොර සහනාධාරය සඳහා වැය කරන මුදලින් කොටසක් ආයෝජනය කළ හැකි අතර, එම ව්‍යාපෘතිය අවසන් වන තුරු දැනට පර්යේෂණ මට්ටමේ පවතින "ජෛව පොස්පේට්" සහනදායී මිලකට ගොවියාට ලබාදීම සඳහා නිෂ්පාදකයාට සහනාධාරයක් ලබාදිය හැකි ය.)

V. දැනට සුළු වශයෙන් භාවිත වන ගොම සහ ගව මුත්‍ර යොදාගනිමින් නිෂ්පාදනය කරනු ලබන ජීව මුත්‍ර ජෛව පොහොර සහ පාංශු ක්ෂුද්‍ර ජීවීන් යොදාගනිමින් නිෂ්පාදනය කරනු

ලබන ජෛව පොහොර දිරිමත් කිරීම සඳහා ජාතික මට්ටමින් නිශ්චිත ව තෝරාගත් ගොවීන් සමග පර්යේෂණ ව්‍යාපෘතියක් කෘෂිකර්ම සහ ගොවිජන සේවා දෙපාර්තමේන්තුව යොදාගනිමින් දියත් කිරීම සඳහා රාජ්‍ය අය වැය මගින් ප්‍රතිපාදන වෙන් කිරීම.

VI. කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ යන්ත්‍රෝපකරණ ආයතනයේ අනුමැතිය අනිවාර්ය කිරීම සහ ආනයනකරුවාට ලබාදෙන බදු සහනය උපකරණ මිල දී ගන්නා පුද්ගලයාට හෝ ආයතනයට ලැබෙන බව සහතික කිරීම සඳහා ක්‍රමවේදයක් හඳුන්වාදීම.

**2.11** I. සියලු ම සුබ සාධන ගෙවීම් එක ම පද්ධතියක් යටතට ගැනීම මුල් කරගෙන අධ්‍යයනයක් කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා විද්වත් කමිටුවක් පත්කිරීමත්, සෑම පවුලකට ම ආර්ථික ඉඩ ප්‍රස්ථා සහ රාජ්‍ය සහනාධාර සාධාරණ ව බෙදී යන බව තහවුරු කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මට්ටමින් අභියාචනා කමිටු පත්කිරීම.

II. එම ක්‍රියාවලිය සම්පූර්ණ වන තෙක් සෑම මට්ටමක ම ප්‍රතිලාභීන්ගේ දැනට ලැබෙන මූල්‍ය ප්‍රතිලාභවලට අතිරේක ව මාසිකව රුපියල් 2,500.00 ක අන්තර්කාලීන දීමනාවක් ගෙවීම හෝ පහළ ම සමාජ ස්ථර සඳහා අවම ආහාර සලාකයක් හඳුන්වාදීම පිණිස රාජ්‍ය ආයතන මගින් ප්‍රතිපාදන වෙන් කිරීම.

**2.12** I. සතොස ආයතනය තරගකාරී සුපිරි වෙළෙඳසැලක් වෙනුවට, අත්‍යවශ්‍ය ආහාර තොග දේශීය ව මිල දී ගැනීම, ආනයනය කිරීම, බෙදාහැරීම, විකිණීම සහ ආරක්ෂණ තොග පවත්වාගෙන යාම සඳහා වූ විශේෂිත රාජ්‍ය ආයතනයක් බවට පරිවර්තනය කිරීම. ඊට සහාය වීම සඳහා රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථාව, සී.ඩබ්.ඊ ආයතනය සහ සමුපකාර වැනි සෙසු රාජ්‍ය ආයතන පද්ධතියට ද වගකීම් පැවරිය යුතු ය. (ආනයන, දේශීය මිල දී ගැනීම, තොග බෙදාහැරීම සහ ආරක්ෂණ තොග පවත්වාගෙන යාම ආදියට අදාළ ව)

II. අඩු ආදායම්ලාභීන්ට ආහාර සහනාධාර සලාක බෙදා හැරීමේ වගකීම ද සතොස ආයතනයට පැවරිය යුතු ය.

III. කුඩා පරිමාණ සිල්ලර වෙළෙඳාම සහ කුඩා පරිමාණ බෙදාහැරීමේ ව්‍යාපාර ආරක්ෂා කිරීම සඳහා, එනම් මහා පරිමාණ සුපිරි අලෙවිසැල් සහ මහා පරිමාණ බෙදාහැරීමේ ආයතන අසීමාන්තික ව වර්ධනය වීම යම් පමණකට පාලනය කිරීම සඳහා, එම මහා පරිමාණ ව්‍යාපාරවලට අදාළව නව පිරිවැටුම් බදු ක්‍රමයක් හෝ නව වැට් බදු ක්‍රමයක් හඳුන්වාදීම.

VI. මහා පරිමාණ සුපිරි වෙළෙඳසැල් මගින් නිෂ්පාදකයාගෙන් අසාධාරණ ලෙස කොමිස් අය කිරීම වැළැක්වීම සඳහා පාරිභෝගික අධිකාරී පනත යටතේ උපරිම සීමාවක් පැනවීම.

**2.13** I. ඖෂධ නියාමන අධිකාරී පනත සංශෝධනය කිරීම මගින් අත්‍යවශ්‍ය ඖෂධ ලයිස්තුව නීතිගත කිරීම සහ ඖෂධ දාමයේ ඖෂධ නිර්දේශ කිරීම සහ නිකුත් කිරීම අනිවාර්ය බවට පත් කිරීම.

II. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් අත්‍යවශ්‍ය ඔ ෟෂධ ලයිස්තුවට අයත් ඖෂධ සෘජු ව ආනයනය කර තොග පවත්වාගෙන යා යුතු බවට නියමයක් පැනවීම සහ සංස්ථාවට අයත් ඖෂධ ජාලය පුළුල් කිරීම සඳහා රාජ්‍ය අය වැය මගින් මූල්‍ය පහසුකම් ලබාදීම. (ආයතනයේ වත්මන් පාලකයන් ඊට සූදානම් නොමැති නම්, වහා ම ඒ සඳහා හැකියාව, මානසික සූදානම්කම, අවංක භාවය සහ නිර්භීතභාවය සහිත කණ්ඩායමක් පත් කිරීම.)

# 3

# දූෂණ වංචා පාලනය සඳහා දැඩි ක්‍රියාමාර්ග ගැනීම. ඊට අදාළ වැරදිකරුවන්ට දඬුවම් ලබා දීම මෙන් ම, ප්‍රබල මහජන අපේක්ෂා සහ ඉල්ලීම් ඉටුකිරීම මගින් රාජ්‍ය පාලනය පිළිබඳ මහජන විශ්වාසය තහවුරු කිරීම.

**3.1** I. පොල්තෙල් සහ සීනි බදු වංචා ඇතුළු විවිධ දේශපාලන පක්ෂ විසින් ඉදිරිපත් කරනු ලබන දූෂණ සහ වංචා පිළිබඳ චෝදනා විමර්ශනය කර දඬුවම් කිරීම සඳහා අර්ධ අධිකරණ බලතල සහිත කොමිසමක් පත් කිරීම.

II. මුදල් අමාත්‍යවරයා සහ අමාත්‍යාංශ නිලධාරීන් විසින් රාජ්‍යයේ මූල්‍ය තත්ත්වය බිඳ වැටීමට ලක් කිරීම සඳහා සැළසුම් සහගත ව රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණයක නිරත වූවා ද යන්න සොයා බැලීම සඳහා ත්‍රිපුද්ගල විශේෂඥ කමිටුවක් පත් කිරීම සහ එම කටයුතු මාස හයක් තුළ අවසන් කිරීම.

III. 2015 වසරේ සිට 2019 වසර දක්වා කාලය තුළ 7.5% ක තරම් ඉහළ පොළියකට ඇමරිකානු ඩොලර් මිලියන 12500ක පමණ ජාත්‍යන්තර බැඳුම්කර නිකුත් කිරීමට අදාළ ක්‍රියාවලිය තුළ අයුතු කොමිස් ගනුදෙනු සිදු වූ බවට මහ බැංකුවේ හිටපු නිලධාරීන් විසින් කරනු ලබන චෝදනා පිළිබඳව වෝහාරික විගණනයක් සිදු කිරීම සහ ඊට අනුව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම.

**3.2** බැඳුම්කර වංචා විමර්ශනය කිරීම සඳහා පත් කළ ජනාධිපති කොමිසමේ වාර්තාව අනුව වැරදිකරුවන්ට නිසි දඬුවම් ලබාදීම සඳහා අල්ලස් සහ දූෂණ පනත් සංශෝධනය කිරීම සහ එම පනත යටතේ නැවත නඩු පැවරීම මෙන් ම එම කටයුතු මාස 3ක් තුළ අවසන් කිරීම.

**3.3** ප්‍රසම්පාදන පනත සම්මත කිරීම සහ ඇමති මණ්ඩලය විසින් ප්‍රසම්පාදන කමිටු පත් කිරීමේ ක්‍රියාවලිය සහ ඒකපාර්ශ්වීය තරගකාරී නොවන ලෙස කොන්ත්‍රාත් ලබා දීමේ ක්‍රියාවලිය අත්හිටුවීම සහ ඊට අදාළව ප්‍රසම්පාදන සංග්‍රහය සහ මාර්ගෝපදේශ සංශෝධනය කිරීම මෙන් ම, එම කටයුතු මාස 3ක් තුළ අවසන් කිරීම.

**3.4** I. දේශපාලන පක්ෂ සහ රාජ්‍ය නොවන සංවිධාන විගණකාධිපතිගේ විගණනයට ලක් කිරීම සහ මැතිවරණ වියදම් ප්‍රසිද්ධ කිරීම සඳහා මැතිවරණ නීති සංශෝධනය කිරීම

II. රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචියට අදාළ නීති සංශෝධනය කිරීම මගින් සියලු ම රාජ්‍ය නොවන සංවිධාන රාජ්‍ය විගණනයට යටත් කිරීම.

**3.5** I. පාර්ලිමේන්තු වරප්‍රසාද පනත සහ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම මගින් පාර්ලිමේන්තුවේ මුදල් කමිටු ශක්තිමත් කිරීම මගින් රාජ්‍ය දූෂණ වංචා පිළිබඳ ව ක්‍රියාමාර්ග ගැනීම සඳහා විශේෂයෙන්ම අල්ලස් කොමිසමට සහ විගණකාධිපති නියෝග කිරීමේ බලය එම කමිටුවලට ලබාදීම සහ ඊට අදාළ ව විගණකාධිපති බලතල ශක්තිමත් කිරීම සඳහා එම පනත සංශෝධනය කිරීම.

II. පාර්ලිමේන්තුව තුළ අමාත්‍යාංශ උපදේශක කාරක සභා පිහිටුවීම මගින් රාජ්‍ය ආයතනවල අයවැය පූර්වගාමී ව සමාලෝචනය කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීම.

**3.6** I. දූෂණ චෝදනා එල්ල වූ අමාත්‍යවරුන්ට අන්තර්කාලීන හෝ ජාතික එකගතා ආණ්ඩුවේ අමාත්‍යධුර ලබානොදීම සහ එම ආණ්ඩුවේ අමාත්‍යධුර සංඛ්‍යාව15කට සීමා කිරීම.

II. එසේ ම, අමාත්‍යවරුන්ට මන්ත්‍රීවරයෙකුට හිමි වරප්‍රසාද පමණක් ලබාදීම.

**3.7** I. විදේශ රැකියා ක්ෂේත්‍රයේ වංචා දූෂණ අවම කිරීම සඳහා අදාළ පනත් සංශෝධනය කිරීම මගින් අභියාචනා මණ්ඩලයක් හරහා පැමිණිලි විභාග කිරීමේ විධිමත් යාන්ත්‍රණයක් හඳුන්වාදීම සහ වැරදි සඳහා වන දඬුවම් ඉහළ දැමීම.

II. රැකියාලාභියාගේ ආපසු ගුවන් ගමන් ටිකට්පතට අදාළ මුදල් තැන්පත් කරන ලෙස රැකියා ඒජන්සියට නියම කිරීම මගින් දූෂිත ක්‍රියා පාලනය කිරීමට පියවර ගැනීම.

**3.8** I. අල්ලස් සහ දූෂණ පනත් සංශෝධනය කිරීම මගින් සුළු පැමිණිලි විභාග කිරීම සඳහා දිස්ත්‍රික් කාර්යාල පිහිටුවීම සහ ඊට අදාළ ව අධිකරණ සේවා විධිවිධාන පනත් සංශෝධනය කිරීම මගින් කම්කරු විනිශ්චය සභාවලට සමාන ආකාරයට විශේෂිත අධිකරණ පද්ධතියක් පිහිටුවීම.

II. රාජ්‍ය සේවය තුළ මහජනයාට වගවීම සහ විනිවිදභාවය තහවුරු කිරීම මෙන්ම, සද්භාවයෙන් වංචාව සහ දූෂණයට එරෙහි ව කටයුතු කරන නිලධාරීන් ආරක්ෂා කිරීම සඳහා නව නීතියක් හඳුන්වාදීම.

**3.9** දේශපාලන නායකයන් විසින් වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දීම අනිවාර්ය කිරීම සහ අසත්‍ය තොරතුරු ලබාදීම ධුරය අහිමි වීමේ වරදක් බවට පත් කිරීම මෙන් ම, මැතිවරණ පනත යටතේ වරදක් බවට පත් කිරීම සඳහා අදාළ නීති සංශෝධනය කිරීම.

**3.10** I. පසුගිය වසර දෙකක කාලය තුළ අත්සන් කළ සහ අත්සන් කිරීමට නියමිත සියලු ම ජාත්‍යන්තර ගිවිසුම්, ව්‍යවස්ථාවේ 157 වැනි වගන්තිය ප්‍රකාර ව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.

II. අනාගතයේ දී ජාත්‍යන්තර ආරක්ෂක, ආර්ථික හෝ වෙළෙඳ ගිවිසුම්වලට අදාළ සාකච්ඡා කිරීමේ ක්‍රියාවලිය තුළ විනිවිදභාවය තහවුරු කිරීම සහ පාර්ලිමේන්තුවේ අනුමැතිය විධිමත් ව ලබාගැනීම සහතික කිරීම සඳහා නව නීතිමය රාමුවක් හඳුන්වාදීම.

**3.11** I. පාස්කු ප්‍රහාරයේ වින්දිතයන්ට සාධාරණය ඉටු නොවන බවට සහ ඉස්ලාම් අන්තවාදී බලවේගවලට ආණ්ඩුව යටත් වන බවට එල්ල වන චෝදනා නිශේධනය කිරීම සඳහා ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුවේ ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික කාරක සභාවේ නිර්දේශ මත පදනම් ව 2021.02.18 දින අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් ඉදිරිපත් කළ යෝජනා 57 මාස 6ක් තුළ ක්‍රියාත්මක කිරීම සඳහා කාර්ය සාධක බලකායක් පිහිටුවීම.

II. අධ්‍යාපන පද්ධතිය තුළ ජාතිකත්වය, ආගම හෝ ආර්ථික තත්ත්වය අනුව දරුවන්ට වෙනස්කම් සිදු නොවන ආකාරයට රට තුළ පවතින සියලුම පෞද්ගලික සහ ආගමික ඉගැන්වීම් මුල්කරගත් පාසල්වල විෂය මාලා සහ ගුරු අත්පොත් අධ්‍යාපන අමාත්‍යාංශයේ නියාමනයට යටත් කිරීම සඳහා පරිපාලන යාන්ත්‍රණයක් පිහිටුවීම සහ දරුවන්ගේ පාසල් අධ්‍යාපන කාලය වසර 12කට අඩු කිරීම මගින් අනාගත පරපුරට රටේ ආර්ථිකයට ඵලදායී ලෙස දායක වීම සඳහා සමාන අවස්ථා නිර්මාණය කිරීම තුළින් තරුණ පරපුර අතර පැන නගින ප්‍රතිවිරෝධතා සහ අන්තවාදී ප්‍රවණතා සමනය කිරීම.

**3.12** මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් සහ සංවිධානාත්මක අපරාධකරුවන් රාජ්‍යයට ඉහළින් රාජ්‍යය යටත් කරන බවට පවතින මහජන මතය වෙනස් කිරීම සඳහා විශේෂ කාර්ය බලකාය සහ ආරක්ෂක හමුදා ඒකාබද්ධ ජාතික යාන්ත්‍රණයක් පිහිටුවීම. මත්ද්‍රව්‍ය නඩු විභාග කිරීම සඳහා විශේෂ අධිකරණ පද්ධතියක් මෙන් ම සැකකරුවන් සහ වැරදිකරුවන් ආරක්ෂිත ව රඳවා තැබීම සඳහා විශේෂිත සිර මැදිරි පද්ධතියක් පිහිටුවීම. ඊට අමතර ව, මත්ද්‍රව්‍ය පාලනය සඳහා මහජන පැමිණිලි ලබාගැනීම සඳහා ප්‍රජා පොලිස් ඒකකය මගින් විශේෂ මහජන කමිටු සහ පාසල් ආශ්‍රිත ආවේක්ෂණ කමිටු පිහිටු වීම.

# 4

# බලශක්ති අර්බුදය විසඳීම සහ දීර්ඝ කාලීන ව බලශක්ති සුරක්ෂිතතාව සහ ඊට අදාළ ව රටේ ස්වාධිපත්‍යය ආරක්ෂා කිරීම.

**4.1** I. ජාතික සුනිත්‍ය බලශක්ති සංග්‍රාමයක් මගින් සුනිත්‍ය බල ප්‍රතිශතය 70% දක්වා ඉහළ දැමීමේ වගකීම සුනිත්‍ය බලශක්ති අධිකාරියට පැවරීම.

II. ඊට අදාළ ව එම පනත සංශෝධනය කිරීම මගින් ආවේක්ෂණ කාර්ය සාධක බලකායක් සහ එම බලකාය යටතේ විදුලි පද්ධතිය ස්ථායිකරණයට අදාළ ව බහුපාර්ශ්වීය විශේෂ තාක්ෂණික කමිටුවක් සහ තොරතුරු කමිටුවක් පිහිටුවීම සහ ඒ මගින් විදුලිබල ඉංජිනේරුවන් විසින් ඉදිරිපත් කරන නිදහසට කාරණා පිළිබඳ ව සොයා බැලීම සහ අදාළ ගැටළුවලට පිළියම් යෙදීම.

III. එම පනත යටතේ අභියාචනා විභාග කිරීම මගින් වැරදි නිවැරදි කිරීම සහ වැරදිකරුවන්ට දඬුවම් නියම කිරීමේ බලය සහිත අභියාචනා කමිටුවක් පත්කිරීම මගින් සුනිත්‍ය බලශක්ති නිෂ්පාදකයින්ගේ දුක්ගැනවිලි සහ පැමිණිලි පිළිබඳ ව ක්ෂණික ව ප්‍රතිචාර දැක්වීම.

**4.2** සියලු ම සුනිත්‍ය බලශක්ති ව්‍යාපෘති අනුමත කිරීමේ බලය සහ විවිධ සුනිත්‍ය බලශක්ති ප්‍රභවයන්ට අනුව විදුලිය මිල දී ගැනීමේදී යොදාගත යුතු මිල සූත්‍ර නියම කිරීමේ බලය සුනිත්‍ය බලශක්ති අධිකාරියට ලබා දීම.

**4.3** සුනිත්‍ය බලශක්ති අධිකාරි පනත යටතේ සුනිත්‍ය බලශක්තිය ප්‍රචලිත කිරීමේ අරමුදලක් පිහිටුවීම සහ සුනිත්‍ය බලශක්ති මිල දී ගැනීමේ දී රාජ්‍ය භාගයක් නියම කිරීම මගින් එම අරමුදල තර කිරීම. ඊට අමතර ව එම අරමුදල සෙස් බදු සහ රාජ්‍ය අරමුදල් මගින් ද පෝෂණය කළ යුතු ය. එම අරමුදල මගින් සුනිත්‍ය බලශක්ති ව්‍යාපෘති දිරිමත් කිරීම සඳහා සහනාධාර ලබා දීම, සුනිත්‍ය බලශක්ති ව්‍යාපෘති පද්ධතියට එක් කිරීම සඳහා අත්‍යවශ්‍ය යටිතල පහසුකම් ලබාදීම, පර්යේෂණ කටයුතු, විශේෂඥ උපදෙස් ලබා ගැනීම, බලශක්ති විගණනය සඳහා පුහුණුව ලබා දීම සහ මහජන අධ්‍යාපන කටයුතු ආදී කටයුතු සඳහා අරමුදල් නිදහස් කළ යුතු ය.

**4.4** ජාතික බලශක්ති පද්ධතියට සම්බන්ධ නොවන, පද්ධතියෙන් පිටත ව්‍යාපෘති සහ කුඩා පද්ධති ව්‍යාපෘති දිරිමත් කිරීම සහ මහා පරිමාණ බලශක්ති පරිභෝජකයන්

විසින් බලශක්ති විගණනය දිරිමත් කිරීම සඳහා රජය මගින් දිරි ගැන්වීමේ පැකේජයක් හඳුන්වා දීම.

**4.5** බලශක්ති කාර්යක්ෂමතාව අනුව උපකරණවලට සහ ආයතනවලට සහතික සහ "තරු" ලබාදීමේ ක්‍රමවේදයක් සුනිත්‍ය බලශක්ති අධිකාරී පනත යටතේ හඳුන්වා දීම මෙන් ම, බලශක්ති පරිභෝජන කාර්යක්ෂමතාව අනුව උපකරණ, ආයතන, ගොඩනැගිලි සහ වාහන සඳහා විශේෂිත සෙස් බදු පැනවීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම. (එම සෙස් බදු සුනිත්‍ය බලශක්ති අරමුදලට බැරවිය යුතු ය.)

**4.6** මහා පරිමාණ ජල විදුලි ව්‍යාපෘති කළමනාකරණය කිරීම සඳහා සුනිත්‍ය බලශක්ති අධිකාරිය, විදුලිබල මණ්ඩලය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ මහවැලි අධිකාරිය ආදී ආයතන ඇතුළත් වන ආකාරයට බහු පාර්ශ්වීය යාන්ත්‍රණයක් පිහිටුවීම සහ එම ක්‍රියාවලිය සුනිත්‍ය බල අධිකාරිය මගින් විගණනයට යටත් කිරීම.

**4.7** සුනිත්‍ය බලශක්ති ව්‍යාපෘති සඳහා ආයෝජන දිරි ගැන්වීම ඉලක්ක කරමින් මහ බැංකුව හරහා විශේෂ පොළී සහනාධාරයක් ලබා දීම සහ එම ව්‍යාපෘති කඩිනමින් පද්ධතියට සම්බන්ධ කිරීම සඳහා මැදිහත් වීමේ වගකීම සුනිත්‍ය බලශක්ති අධිකාරියේ වගකීමක් බවට පත් කිරීම.

**4.8** එල්.ඊ.ඩී බල්බ භාවිතය 100% දක්වා වර්ධනය කිරීම සඳහා විශේෂිත බදු සහන ලබා දීම සහ පළාත් පාලන ආයතනවලට මූල්‍ය දිරිගැන්වීම් ලබා දීම.

**4.9** සුනිත්‍ය බලශක්ති ව්‍යාපෘති සඳහා ආනයනය කරනු ලබන උපකරණ සහ උපාංග සියලු බදුවලින් නිදහස් කිරීම සහ දේශීය ව ඒවා නිෂ්පාදනය කිරීම දිරි ගැන්වීම සඳහා ඉඩම් සහ වෙනත් සුවිශේෂී බදු සහන ලබා දීම.

**4.10** සියලු බලශක්ති ප්‍රභව සඳහා සැබෑ පිරිවැය පිළිබිඹු වන ආකාරයට විනිවිද භාවයක් සහිත ව මිල සූත්‍ර අනුව මිල නියම කිරීම.

**4.11** දුම්රිය පද්ධතිය විදුලිකරණය කිරීම මගින් දැනට 1%ක මට්ටමේ පවතින දුම්රිය භාණ්ඩ ප්‍රවාහනය සහ 3% මට්ටමේ පවතින මගී ප්‍රවාහනය ප්‍රශස්ත මට්ටමක් දක්වා වර්ධනය කිරීම සඳහා ජාතික මට්ටමේ ආයෝජන ව්‍යාපෘති අතරින් ඉහළ ම ජාතික ප්‍රමුඛතාව ලබාදීම මෙන් ම, නව ජනාවාස ඉදිකිරීමේ දී දුම්රිය ස්ථාන පාදක කරගැනීම සඳහා පෞද්ගලික සහ රාජ්‍ය ඉඩම් නිදහස් කිරීම.

**4.12** මැද පෙරදිග ඛනිජ තෙල් ඒකාධිකාරයෙන් ගැලවීම සඳහා රුසියාව සමග එකඟතාවකට පැමිණ ඒකාබද්ධ රාජ්‍ය ව්‍යාපෘතියක් ලෙස ත්‍රිකුණාමලය ආශ්‍රිත ව නව පිරිපහදුවක් ආරම්භ කිරීම සහ පළමු වටයේ දී ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය තුළ ශ්‍රී ලංකාවේ රජයට භාවිත කළ හැකි ටැංකි 84 යොදාගනිමින් මාස 3ක කාලයක් සඳහා ආරක්ෂිත තෙල් තොගයක් පවත්වාගෙන යාම.

**4.13** රාජ්‍ය සේවය තුළ ජාතික මට්ටමින් පිරිස් බලය නැවත ස්ථාන මාරු කිරීම් මගින් සහ රැස්වීම් සහ සෙසු සන්නිවේදන කටයුතු සඳහා නව තාක්ෂණය යොදා ගැනීම මගින් මෙන්ම පරිපාලන ක්‍රමවේද සහ පරිපාලන සංස්කෘතිය වෙනස් කිරීම සඳහා මූල්‍ය උපාංග යොදා ගැනීම මගින් ගමනාගමන අවශ්‍යතා සීමා කිරීම. (මෙම ක්‍රියාවලිය තුළ වාහන සහ ඉන්ධන භාවිතයට අදාළව රාජ්‍ය සේවකයාගේ මහජන වගවීම තහවුරු කිරීම සඳහා ආයතන මට්ටමින් වාර්ෂික ඉන්ධන සහ වාහන භාවිතයට අදාළ විශේෂ විගණනයක් සිදු කර එම තොරතුරු ප්‍රසිද්ධ කිරීම මගින් පරිපාලනයට මානසික බලපෑමක් සිදු කිරීම ද වැදගත් වේ.)

# 5

## ආර්ථික මොඩලය වෙනස් කිරීමේ දිගුවක් ලෙස ජාතිය සතු මහා සම්පත් විභවය සහ භූ දේශපාලන වාසිදායක තත්ත්වයන් යොදාගනිමින් ස්වෛරී බලවත් රටක් ලෙස නැගී සිටිය හැකි බවට මහජන විශ්වාසය ගොඩනැගීම තුළින් මහජන සහාය දිනා ගැනීම සඳහා ජාතික උපායමාර්ගික ව්‍යාපෘති පද්ධතියක් ප්‍රකාශයට පත් කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා බහු පාර්ශ්වීය කාර්යසාධන යාන්ත්‍රණයක් පිහිටුවීම.

**5.1** I. රටේ පවතින 35,000කට ආසන්න කුඩා වැව් හා අමුණු සහ ඒ ආශ්‍රිත පරිසර සියල්ල, දැනට සිදුකරන ආකාරයට අහඹු ලෙස සහ සංවර්ධනයේ නාමයෙන් අවිධිමත් ලෙස විනාශ කිරීම වෙනුවට පද්ධතියක් ලෙස බහුපාර්ශ්වීය විද්වත් කමිටුවක අධීක්ෂණය යටතේ යුද හමුදාව සතු සම්පත් සහ පිරිස් බලය යොදාගනිමින් යථාවත් කිරීම මෙන් ම, ඒ සඳහා පළාත් පාලන ආයතන සහ මහජන සහාය ලබාගැනීම.

II. පළාත් පාලන ආයතන සතු සම්පත් සහ ගොවි සංවිධාන සහ වෙනත් බහුජන සංවිධාන, විශේෂයෙන් ම පාසල් සහ පන්සල් යොදා ගනිමින් මෙම පරිසර පද්ධති ආශ්‍රිත ව ජෛව විවිධත්වය අනුව ආහාර ශාක ප්‍රචලිත කිරීමේ ජාතික ව්‍යාපෘතියක් දියත් කිරීම මගින් වගා කළ හැකි සෑම බිම් අඟලක් ම වගාකිරීම ජාතික සංස්කෘතික උරුමයක් බවට පත් කිරීම.

III. සෑම ජලාශයක් ආශ්‍රිත ව ම මිරිදිය මාළු නිෂ්පාදනය උපරිම මට්ටමින් පවත්වාගෙන යෑම සඳහා මත්ස්‍ය පැටව් බෝ කිරීම, පර්යේෂණ සහ තාක්ෂණික සහය ලබාදීම සඳහා අදාළ රාජ්‍ය ආයතන යොදාගනිමින් දිස්ත්‍රික් මට්ටමින් ඒකාබද්ධ යාන්ත්‍රණයක් පිහිටුවිය යුතු ය.

**5.2** I. සමස්ත රට ම වෘත්තීය පුහුණු වැඩ බිමක් බවට පත් කිරීම සඳහා දැනට පවතින පුහුණු ආයතන පද්ධතිය පුළුල් කිරීමට අමතර ව ආරක්ෂක හමුදාව සතු සම්පත් යොදාගනිමින් නව පුහුණු ආයතන ජාලයක් ආරම්භ කිරීම.

II. එම සිසුන්ට විශ්වවිද්‍යාල මට්ටම දක්වා අධ්‍යාපනය අවසන් කිරීමට දිස්ත්‍රික් මට්ටමින් උසස් අධ්‍යාපන ආයතන ජාලයක් පිහිටුවීම සඳහා ඊට අදාළ ජාතික ක්‍රියාකාරී සැලසුමක් ප්‍රකාශයට පත් කිරීම මගින් වෘත්තීය අධ්‍යාපන දිරිමත් කිරීම.

III. රාජ්‍ය සේවයේ අතිරික්ත සේවකයින්, රැකියා වියුක්ත සහ අර්ධ රැකියා නියුක්ත තරුණ තරුණියන් සහ ත්‍රී රෝද රථ රියදුරන් මෙන් ම ආරක්ෂක හමුදා සාමාජිකයන්, ඔවුන් විසින් ලබාගෙන ඇති පෙර පුහුණුව සැලකිල්ලට ගෙන කඩිනම් ව්‍යාපෘතියක් ලෙස වෘත්තීය පුහුණුව ලබාදීම හරහා විදේශ රැකියා වෙළෙඳපොළ අත්පත්කර ගැනීම මුල්කරගෙන 'මහපොළ' ශිෂ්‍යත්වයට සමාන දිරි ගැන්වීමේ ආධාර ක්‍රමයක් ද හඳුන්වා දීම.

**5.3** I. විදේශ ආයෝජන දෙස පමණක් බලා සිටීම වෙනුවට උපාය මාර්ගික කර්මාන්ත, එනම් දේශීය අමුද්‍රව්‍ය සහ දේශීය දැනුම භාවිත කරන කර්මාන්ත සහ වටිනාකම් එකතු කිරීමේ ජාලයට බහුතර ජනතාවක් දායක වන කර්මාන්ත සඳහා ආයෝජනය කිරීම සඳහා දේශීය කර්මාන්තකරුවන් පෙළඹවීම මුල් කරගෙන දිරි ගැන්වීම් පැකේජයක් හඳුන්වා දීම.

II. එම කර්මාන්ත පද්ධතිය ආරක්ෂා කිරීම සඳහා උපාය මාර්ගික කර්මාන්ත ආරක්ෂා කිරීමේ පනත නමින් විශේෂ නීතියක් හඳුන්වා දීම.

III. පළමු වටයේ දී ඒ මගින් මිනිරන්වලින් ග්‍රැෆීන් නිෂ්පාදනය, ඛණිජ වැලිවලින් ටයිටේනියම් ආදී වටිනා ලෝහ වර්ග නිෂ්පාදනය, කිරි පිටි නිෂ්පාදනය, සීනි, දේශීය ඖෂධ සහ රූපලාවණ්‍ය කර්මාන්ත ආදිය ආරම්භ කිරීම සඳහා එම කර්මාන්ත උපායමාර්ගික කර්මාන්ත ලෙස නම් කර ජාතික ව්‍යාපෘතියක් ප්‍රකාශයට පත් කිරීම. (උදාහරණයක් ලෙස, වනාන්තර නොවන ඌන භාවිත ඉඩම් පාරිසරික සාධක සලකිල්ලට ගනිමින් ඵලදායි ලෙස යොදා ගැනීම සහ එම ක්‍රියාවලිය තුළ නව බලශක්ති ප්‍රභවයක් උත්පාදනය කිරීම මෙන්ම රට, සීනිවලින් ස්වයං පෝෂිත කිරීම මුල් කරගෙන සීනි කර්මාන්තය සඳහා විශේෂිත ප්‍රමුඛතාවක් සහ විශේෂ දිරි ගැන්වීම් පැකේජයක් ලබා දිය යුතු ය. ඒ සඳහා රාජ්‍ය අංශය සහ දේශීය පෞද්ගලික අංශය ඒකාබද්ධ ව්‍යාපෘති මොඩලයක් හඳුන්වා දිය හැකි ය.)

**5.4** I. ශ්‍රී ලංකාවට අයත් සමස්ත මුහුදු කලාපය ආවරණය වන ලෙස මව් යාත්‍රා ජාලයක් ස්ථාපිත කිරීම මගින් රටට අයත් සමස්ත මහා සාගරය ම ආර්ථික කලාපයක් බවට පත් කිරීම මගින් නිල් ආර්ථිකයට පණ දීම.

II. ඒ ආකාරයට පරණ යකඩ බරට මිල දී ගත හැකි මව් යාත්‍රා ජාලය යොදාගැනීම මගින් කුඩා සහ මධ්‍යම පරිමාණ යාත්‍රාවලට සේවා සැපයීම, ආරක්ෂක සහ සන්නිවේදන කටයුතු පවත්වාගෙන යාම, කෙටි කාලීන ව මාළු කල් තබා ගැනීම සඳහා අතුරු නිෂ්පාදන සකස් කිරීම, සාගර ජීවී පර්යේෂණ සහ සාගර පරිසර පද්ධති සංවර්ධන කටයුතු සඳහා දායක වීම ආදී බහුවිධ ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැලසීම.

**5.5** I. අප රටේ සංචාරක කර්මාන්තය දේශීය දැනුම් පද්ධතිය, විශේෂයෙන් ම දේශීය වෛද්‍ය ක්‍රමය, දේශීය ආහාර, පරිසර පද්ධති සහ සංස්කෘතික උරුමය මුල්කරගත් සංචාරක කර්මාන්තයක් බවට නැවත ස්ථානගත කිරීම සඳහා කුඩා පරිමාණ සේවා සපයන්නන්ට ප්‍රමුඛතාව ලබාදෙමින් ජාතික ව්‍යාපෘතියක් දියත් කිරීම සඳහා දිරිගැන්වීම් පැකේජයක් සහිත ව රාජ්‍ය මැදිහත් වීම.

II. ඊට අදාළ ප්‍රායෝගික ක්‍රියාකාරකම් දියත් කිරීම සඳහා අදාළ සියලු ආයතන ඒකාබද්ධ කර බහු පාර්ශ්වීය කාර්යසාධන යාන්ත්‍රණයක් පිහිටුවීම.

**5.6** I. අප රටේ සුවිශේෂී ජෛව විවිධත්වයට අනුව සෑම බිම් අඟලක් ම වගා කිරීමේ සංකල්පය යටතේ 800කට ආසන්න ඌණ භාවිත ආහාර ප්‍රභේද සහිත දේශීය ආහාර විවිධත්වයට නැවත පණ දීම මගින් ලෝකයේ ප්‍රමුඛතම ආහාර විවිධත්වය සහිත ආහාර නිෂ්පාදකයා වීම සඳහා ඌණ පරිභෝජන ආහාර ශාක ප්‍රචලිත කිරීමේ ජාතික ව්‍යාපෘතියක් ප්‍රකාශයට පත් කිරීම.

II. ඊට අදාළ ව පැළ තවාන් ආරම්භ කිරීම සඳහා රජයට අයත් ගොවිපොළ පද්ධතිය යොදා ගැනීම සහ පෞද්ගලික අංශයට තාක්ෂණික සහාය සහ දිරි ගැන්වීම් ලබාදීම.

III. ඊට අමතර ව රජයේ ගොවි පොළවල් ජාලය යොදාගනිමින් ආදර්ශ වගා ආරම්භ කිරීම.

IV. "ඌණ භාවිත" ශාක ප්‍රචලිත කිරීම සඳහා රාජ්‍ය ආයතන, පාසල්, පන්සල්, පළාත් පාලන ආයතන සහ මහජන සංවිධාන යොදා ගැනීම.

V. එම ක්‍රියාවලියට පහසුකම් සලසන ආකාරයට ජාතියේ පරිභෝජන සංස්කෘතිය වෙනස් කිරීම සඳහා පාසල් සහ රාජ්‍ය ආයතන ආශ්‍රිත ව දේශීය ආහාර ප්‍රචලිත කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ රටේ ආහාර විවිධත්වය සංචාරක කර්මාන්තය තරගකාරී ව ප්‍රවර්ධනය කිරීම සඳහා යොදාගැනීම.

**5.7** අප රට සතු ජෛව විවිධත්වය සහ ඒ මත පදනම් වූ ආහාර නිෂ්පාදන පද්ධතිය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන බීජ සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සම්පූර්ණයෙන්ම පරාධීනත්වයෙන් ගලවා ගැනීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ රජය සතු පර්යේෂණ ආයතන සහ වෙනත් ගොවිපොළ ජාල එක් නිෂ්පාදන පද්ධතියක් බවට පත් කිරීම මගින් ජාතික බීජ සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදන වැඩසටහනක් ආරම්භ කිරීම.

**5.8** I. රටේ භූමියේ සීමාකම අතික්‍රමණය කිරීම මගින් ගොවියාගේ ආදායම් වැඩි කිරීම සහ ගොවිතැන් ක්‍රම වෙනස්කිරීම මෙන්ම, ආහාර සුරක්ෂිතතාව මුල් කරගෙන බෝග වගාව සමග කිරි ගොවිතැන ඒකාබද්ධ කිරීම සඳහා එනම් අවම වශයෙන් බෝග වගාවේ ගොවීන්ගෙන් 80% කිරි ගොවිතැන සඳහා පෙළඹවීම මුල් කරගෙන ජාතික කිරි ගව අභිජනන වැඩසටහනක් ආරම්භ කිරීම..

II. ඊට සමගාමී ව බෝග වගාව සහ කිරි ගොවිතැන ඒකාබද්ධ කිරීම මුල්කරගෙන ගොවියා දිරිගැන්වීම සඳහා දිරි ගැන්වීමේ පැකේජයක් හඳුන්වාදීම මගින් රට කිරිවලින් ස්වයංපෝෂිත කිරීම මෙන් ම, ගොවියාගේ ආදායම් මට්ටම ඉහළ දැමීම.

**5.9** I. ජාතිය සතු මහා ඛනිජ සම්පත්වලින් එනම් ඛනිජ තෙල්, ස්වාභාවික ගෑස්, මිනිරන්, ඛණිජ වැලි සහ මැණික් ආදී මහා විභවය සහිත කර්මාන්ත සංවර්ධනය සඳහා දේශීය සහ විදේශීය පෞද්ගලික සහ රාජ්‍ය ඒකාබද්ධ ව්‍යාපෘති දියත් කිරීම සඳහා විශේෂ නීතියක් යටතේ ඛනිජ සම්පත් ආයෝජන ප්‍රවර්ධන මණ්ඩලයක් මගින් අදාළ රාජ්‍ය ආයතන පද්ධතිය ඒකාබද්ධ කිරීම සහ ආයෝජකයන් දිරි ගැන්වීම සඳහා සුවිශේෂී ආයෝජන බදු සහන පැකේජයක් හඳුන්වා දීම.

II. එම පනත යටතේ ඛණිජ සම්පත් ප්‍රතිපත්තිය හඳුන්වාදීම මගින් එම සම්පත්වලින් ලැබෙන "රාජ්‍යභාගය" රටේ පොදු ජන යහපතට යොදවන බව සහතික කිරීම.

**5.10** ජාතිය සතු මහා මිනිස් සම්පත සහ ස්වභාවික සම්පත් මෙන් ම දේශීය දැනුම් පද්ධතියෙන් උපරිම ආර්ථික ප්‍රතිලාභ අත්පත් කරගැනීම සඳහා සංවර්ධන ක්‍රියාවලියේ අත්‍යවශ්‍ය පැතිකඩක් ලෙස පර්යේෂණ සහ සංවර්ධන, නවෝත්පාදන සහ තාක්ෂණ හුවමාරුව සඳහා ඉහළ ප්‍රමුඛතාවක් ලබාදීම මෙන් ම ඊට අදාළ ක්‍රියාමාර්ග දිරිමත් කිරීම සඳහා ජාතික අයවැය මගින් වාර්ෂිකව නිශ්චිත ප්‍රතිශතයක් ලෙස ප්‍රතිපාදන වෙන් කිරීම.

**5.11** I. වර්ග කිලෝමීටර් 2,000,000කට ආසන්න ශ්‍රී ලංකාවට අයත් ගුවන් තොරතුරු කලාපය ලෝක සිතියමේ පිහිටා ඇති වාසිදායක තත්ත්වය මත පදනම් ව ඊට අදාළ ආර්ථික, භූ දේශපාලන සහ යුදමය වැදගත්කම සැලකිල්ලට ගෙන අප රට සතු ගුවන් තොරතුරු කලාපයේ අනාගත සංවර්ධන කටයුතු නිර්ණය කිරීම සඳහා දේශීය විශේෂඥයන්ගෙන් සමන්විත උපදේශක කමිටුවක් පත් කිරීම.

II. එම කමිටුව මගින් ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය සමග සාකච්ඡා කර දැනට අවිධිමත් ලෙස ඉන්දියාවට පවරා ඇති වර්ග කිලෝමීටර් 300,000ක පමණ ගුවන් කලාපය නැවත පවරාගැනීම සඳහා කටයුතු කිරීම.

III. ඒ සියල්ලට පහසුකම් සැලසීම සඳහා ශ්‍රී ලංකාවේ ගගන නාවික තොරතුරු සේවාව ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ නිර්දේශවලට අනුව යාවත්කාලීන කිරීම සඳහා සිවිල් ගුවන් සේවා පනත සංශෝධනය කිරීම.

IV. එමෙන් ම මත්තල සහ කටුනායක ගුවන්තොටුපොළ ඒකාබද්ධව කලාපීය ගුවන් ගමන් කේන්ද්‍රයක් ස්ථාපිත කිරීම සඳහා දෙස් විදෙස් විශේෂඥ සහාය ලබාගනිමින් ජාතික සැලසුමක් සකස් කිරීම.

V. ඊට අමතර ව ශ්‍රී ලංකන් ගුවන් සේවාව සහ මිහින් ලංකා ගුවන් සේවාව කළමනාකරණය කළ පිරිස් විසින් එම විභවය අනුව කටයුතු නොකර වංචා දූෂණ මගින් එම ජාතික අවශ්‍යතාව පිටු දැකීම පිළිබඳ ව පුළුල් පරීක්ෂණයක් සිදුකර අදාළ වැරදි නිවැරදි කිරීම. එසේම ශ්‍රී ලංකාවේ ගුවන් තොටුපළවල් සංවර්ධනය කරන මුවාවෙන් ඒවායෙහි ඵලදායිතාවය සූක්ෂ්ම ලෙස පහත හෙලීමට කටයුතු කිරීම සම්බන්ධව විශේෂඥ කමිටුවක් මගින් විමර්ශනයට ලක් කර ඒවායෙහි වැරදි නිවැරදි කිරීම.

# විශේෂ ප්‍රතිඥාවක් මගින් මහජන සැකය සහ අවිශ්වාසය දුරු කිරීම:

## මහජන විශ්වාසය තහවුරු කිරීම සහ මහජන සහාය දිනාගැනීම සඳහා පහත සඳහන් කරුණු ඇතුළත් විශේෂ ප්‍රතිඥාවක් ලබාදීම සහ ඊට අදාළ ස්ථාවරයන් අනාගත ව්‍යවස්ථා සංශෝධනයක දී ව්‍යවස්ථාවට ඇතුළත් කරන බවට සහතික වීම.

I. නිදහස් අධ්‍යාපනයේ මූලධර්මවලට පටහැනි ආකාරයට රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය යොදා ගනිමින් පෞද්ගලික විශ්වවිද්‍යාල ප්‍රචලිත කිරීම සඳහා ඉදිරිපත් කළ කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල පනත් කෙටුම්පත සහ ඊට සමගාමීව සකස් කළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා පනත් කෙටුම්පත සම්මත නොකරන බවට, (පෞද්ගලික අධ්‍යාපන ආයතන ස්වාධීන ව පැවතීම සහ ඒවා රජයේ නියාමනයට යටත් කිරීමේ වැදගත්කම මෙම ප්‍රතිඥාව මගින් අවතක්සේරු නොකළ යුතු ය.)

II එම්.සී.සී. ගිවිසුම අත්සන් නොකරන බවට සහ ඊට අදාළ ඉඩම් ප්‍රතිසංස්කරණ නීති සම්මත නොකරන බවට,

III. සියලු ම ජාත්‍යන්තර ගිවිසුම් ව්‍යවස්ථාවේ 157 වගන්තිය ප්‍රකාර ව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් තොර ව අත්සන් නොකරන බවට,

VI. ජනවරම ලැබී ඇත්තේ නව ව්‍යවස්ථාවක් සම්මත කිරීම සඳහා පමණක් වන බැවින්, ජනවරමට පටහැනි ව අවිධිමත් ලෙස ව්‍යවස්ථා සංශෝධන සිදු කිරීමට උත්සාහ කිරීම මගින් රට බෙදුම්වාදයේ ගොදුරක් බවට පත් නොකරන බවට,

V. ජාතියේ අනාගත පරපුර සතු උපාය මාර්ගික මර්මස්ථාන විශේෂයෙන් ම වරායවල්, ගුවන්තොටුපලවල් සහ රාජ්‍ය ආයතන මෙන් ම ඛණිජ සම්පත් සහ ඉඩම් විදේශීය අයිතියට පවරා නොදෙන බවට

# පොදු කොන්දේසි

I. මෙම යෝජනාවලිය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහා ලේකම් කාර්යාලයක් පිහිටුවිය යුතු ය. එසේ ම, සෑම ක්‍රියාකාරකමට ම අදාළ ව සම්බන්ධීකාරකවරයෙකු පත් කළ යුතු අතර, ජනමාධ්‍යයට සහ මහජනයාට ප්‍රගතිය වාර්තා කිරීම සහ ඊට අදාළව ප්‍රශ්න කිරීම සඳහා යාන්ත්‍රණයක් සකස් කළ යුතු ය.

II. එම යාන්ත්‍රණය අධීක්ෂණය කිරීම සඳහා 'මව්බිම ලංකා පදනම' සහ ජාතික සංවිධාන නියෝජිතයින්ගෙන් සමන්විත මහජන අධීක්ෂණ මණ්ඩලයක් පිහිටුවීම.

III. මෙම යෝජනා මත පදනම්ව ඊට පහසුකම් සැලසීම සඳහා නව අයවැයක් ඉදිරිපත් කිරීම.

IV. වසරක කාලයක් තුළ අර්බුදය ජය ගැනීමට අදාළව ඉටුකළ යුතු මූලික කොන්දේසි ඉටුකිරීමෙන් පසුව නව ව්‍යවස්ථාව සම්මත කිරීම.

V. ඉන් පසුව නව ව්‍යවස්ථාව යටතේ නව මැතිවරණ ක්‍රමයක් තුළ පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීම.

VI. අන්තර්කාලීන හෝ ජාතික එකඟතා ආණ්ඩුවේ පාලන ක්‍රියාවලිය තුළ විනිවිදභාවය තහවුරු කිරීම සඳහා මහජනයා සහ ජනමාධ්‍ය දැනුවත් කෙරෙන සන්නිවේදන යාන්ත්‍රණයක් හඳුන්වාදීම.

# පිළිගනිමු!
# එක්වෙමු!
# ක්‍රියාත්මක වෙමු!
# නැතිනම් වැනසෙමු!

## අනුග්‍රහය

ජාතික විද්වත් භික්ෂු සංසදය

මව්බිම ලංකා පදනම

ජාතික සංවිධාන එකමුතුව

ගෝලීය ශ්‍රී ලාංකික සංසදය - විධායක සභාව

දේශහිතෛෂී ජාතික ව්‍යාපාරය

56 දරුවෝ සංවිධානය

ධර්මපාල පරපුර සංවිධානය

ඉංජිනේරු වෘත්තීයවේදීන්ගේ සංගමය

මහජන යුතුකම් කේන්ද්‍රය

දේශප්‍රේමී විද්වත් සංසදය

ලක්දිරිය කාන්තා පදනම

යුක්තිය සහ පරමාධිපත්‍ය උදෙසා ජනතා හඬ

සම්ප්‍රදායානුකූල පොල්තෙල් නිෂ්පාදකයින්ගේ සංගමය

විජයග්‍රාහී ජාතික සංවිධානය

ජාතික මහජන සභාව

**(ජාතික ප්‍රතිමෙහෙයුම සඳහා වන බහුජන සංවිධාන නියෝජිත එකතුව)**